දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary: 2784812

කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.

"இசுருபாயா"
பத்தரமுல்ல.

"Isurupaya"
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. ..........................................

මගේ අංකය / எமது இல. / My No. ඊඩී/2/29/10/35/5

දිනය / திகதி / Date 2008.11. 21

චක්‍රලේඛ අංක: 2008/45

සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන් වෙත,

## ශ්‍රී ලංකා ගුරු සේවයේ වෘත්තීය සුදුසුකම් රහිත උපාධිධාරී ගුරුවරුන්ට සහන සැලසීම

1994.10.06 දින සිට ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය 1995.04.03 දිනැති අංක 865/3 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත්කොට ඇති අතර, ඉන් පසුව ගත් අමාත්‍ය මණ්ඩල තීරණ මඟින් එම ව්‍යවස්ථාව අවස්ථා කිහිපයකදී සංශෝධනයට ලක්ව ඇත. එසේම මගේ අංක: 2005/04 හා 2005.05.19 දිනැති චක්‍රලේඛයේ 2-IV වගන්තියෙන් 1994.10.06 දිනට වයස අවු: 45 ඉක්ම වූ වෘත්තීය සුදුසුකම් රහිත ගුරු භවතුන් වෘත්තීය සුදුසුකම් සහිත ගුරු භවතුන් සේ සලකා ශ්‍රී ලංකා ගුරු සේවයට අන්තර්ග්‍රහණය කළ යුතු වේ. ඒ සඳහා භාවිතා කළ යුත්තේ වෘත්තීය සුදුසුකම් සහිත අන්තර්ග්‍රහණ වගු වේ. එසේ වුවත් මෙම ගුරු භවතුන් 1 වන පන්තියට උසස්කිරීම සඳහා අමාත්‍යාංශය පිළිගත් වෘත්තීය සුදුසුකම් ලබා තිබිය යුතුය යනුවෙන් සඳහන් වේ. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ එම අවශ්‍යතාවන්ගෙන් නිදහස් කිරීම සඳහාය.

02. ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව අනුව 1994.10.06 දින සිට ක්‍රියාත්මකවන පරිදි ශ්‍රී ලංකා ගුරු සේවයේ 2-II ශ්‍රේණියට හා 2-I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබූ වෘත්තීය සුදුසුකම් රහිත උපාධිධාරී ගුරු භවතුන්ට, වෘත්තීය සුදුසුකම් ලබා ගන්නා තෙක්ම ශ්‍රී ලංකා ගුරු සේවයේ 2-II ශ්‍රේණියෙන් හෝ 2-I ශ්‍රේණියෙන් ඔබ්බට උසස්වීම් අහිමි කොට තිබිණි.

03. 1994.10.06 දිනට වෘත්තීය සුදුසුකම් රහිත උපාධිධාරීන් හා සමාන වෙනත් ගුරු භවතුන්ට මගේ 2005.05.19 දිනැති 2005/04 චක්‍රලේඛයෙන් සලසා ඇති සහන, මෙම ගුරු භවතුන්ටද ලබාදීම සාධාරණවන හෙයින්,

(i) 1994.10.06 දිනට පෙර ගුරුවරුන් ලෙස පත්වීම් ලැබූ ශ්‍රී ලංකා ගුරු සේවයේ වෘත්තීය සුදුසුකම් ලබා නොගත් උපාධිධාරී ගුරු භවතුන් වෘත්තීය සුදුසුකම් සහිත ගුරුවරුන් ලෙස සලකා ශ්‍රී ලංකා ගුරු සේවයට අන්තර්ග්‍රහණය කිරීම හා එම සේවයේ උසස්වීම් ලබාදීමේදී වෘත්තීය සුදුසුකම් සහිත ගුරුභවතුන් ලෙස සලකා කටයුතු කිරීමටත්,

(ii) මෙම සහනය මත ඉහත ගුරු භවතුන්ට හිමිවන වැටුප් 2004.12.31 දින දක්වා හිඟ වැටුප් රහිතව 2005.01.01 දින සිට අදාළ ගෙවීමටත්,

(iii) ශ්‍රී ලංකා ගුරු සේවය හා සමාන්තරව ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා පරිවේනාචාර්ය සේවයේද, ශ්‍රී ලංකා පෞද්ගලික පාසල් ගුරු සේවයේද මෙම සංශෝධනය මේ හා සමානවම ක්‍රියාත්මක කිරීමටත්, කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

04. ශ්‍රී ලංකා ගුරු සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබ දැනට විශ්‍රාම ලබා ඇති ගුරු භවතුන්ටද මෙය යථා යෝග්‍ය වන පරිදි අදාළ කර ගත යුතුය.

05. මෙහි දැක්වෙන සංශෝධන හා ඊට අදාළ උපදෙස් පරිදි උසස්වීම් ලැබීමට හිමිකම් ලබා සිටින සියලුම ගුරු භවතුන්ට උසස්වීම් ලබා දීමට නොපමාව කටයුතු කරන්න.

06. මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන පරිදි කටයුතු කිරීමේදී යම් ගැටළුවක් වේනොත් මා විමසන ලෙසද වැඩි දුරටත් දන්වමි.

එම්.එම්.එන්.ඩී. බණ්ඩාර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්:

(i) ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - දැ.ගැ.ස. සහ අ.ක.ස.
(ii) පළාත් ප්‍රධාන ලේකම්වරුන් - දැ.ගැ.ස. සහ අ.ක.ස.
(iii) පළාත් අධ්‍යාපන ලේකම්වරුන් - පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් මත අ.ක.ස.
(iv) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - දැ.ගැ.ස. සහ අ.ක.ස.
(v) කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - දැ.ගැ.ස. සහ අ.ක.ස.
(vi) කොට්ඨාශ භාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - දැ.ගැ.ස. සහ අ.ක.ස.